# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 2032/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 26/07/2024<br>පැය 2240 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරීන්ගේ පුහුණු වැඩමුළුව සාර්ථකව නිමාවිය - කටාන ජාතික පොලිස් අභ්‍යාස ආයතනය.**

අතුරුදහන් වූ සහ සූරාකෑමට ලක් වූ ළමුන් සඳහා ජාතික මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති NCMEC (The National Center For Missing And Exploited Children) ආයතනයේ සහ International Justice Mission ආයතනයේ දායකත්වයෙන් ලංකාවේ ළමුන් සම්බන්ධ සිද්ධීන් විමර්ශනය කිරීම පිළිබඳ කොට්ඨාස ළමා හා කාන්තා කාර්යංශවලට අනුයුක්ත පොලිස් නිලධාරීන් 15 දෙනෙකුට පුහුණු පාඨමාලාවක් 2024.07.22 වන දින සිට 2024.07.26 වන දින දක්වා කටාන ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේදී පවත්වන ලදී.

මෙම පාඨමාලාවේ සමාප්තිය 2024.07.26 වන අද දින පස්වරුවේදී ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති රේණුකා ජයසුන්දර මහත්මියගේ ප්‍රධානත්වයෙන් කටාන ජාතික පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී පැවැත්විණි.

මෙම NCMEC ආයතනය විසින් ආසියාතික රටවල සේවා සපයන ආයතන 140 කට අධික ප්‍රමාණයක් ඇති අතර එමගින් දරුවන් අන්තර්ජාලය ඔස්සේ ලිංගික සූරාකෑමට හා ළමුන්ගේ අසභ්‍ය දර්ශන පළ කිරීම සම්බන්ධව රටවල් 150 ක විමර්ශන වලට තොරතුරු සපයනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකාවට තොරතුරු ලබා දීම සඳහා NCMEC ආයතනය විසින් ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා කාර්යංශ තෝරාගෙන ඇති අතර එම අංශවල රාජකාරි නියුතු නිලධාරීන් වෙත මෙම පුහුණු පාඨමාලාව පවත්වා ඇත. එමගින් ළමුන්ගේ ලිංගික සූරාකෑම් සහ අසභ්‍ය වීඩියෝ දර්ශන වලට අදාල තොරතුරු ඇසුරින් එවැනි දර්ශන නිෂ්පාදනය කරන, බෙදාහරින, ඇතුලත් කරන සහ නරඹන පුද්ගලයන් පිළිබඳව විමර්ශන කටයුතු සිදු කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දී ඇත.

META සහ International Justice Mission යන ආයතන විසින් සම්පත් දායකත්වය සපයා ඇති අතර META ආයතනයේ නියෝජිතයින් 08 දෙනෙකු හා නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරු කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම පුහුණු පාඨමාලාව පවත්වන ලදී.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්


PROJECT
BOOST
IJM


PROJECT
BOOST
IJM


PROJECT
BOOST
SOUVENIR
IJM


PROJECT
BOOST


WCI SEMBAPERUMA









**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**